# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.01.31 පැය 1620 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 185 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

### 01. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුර

2025.01.30 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කොස්ගම පොලිස් වසමේ කොස්ගම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 26 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කොස්ගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන කොස්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

කොස්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. ගංජා හේන් 03 ක් වටලා සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සූරියවැව කඳවුර.

2025.01.30 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සූරියවැව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරු මත කොස්ලන්ද පොලිස් වසමේ බලහරුව කැලෑ ප්‍රදේශයේදී ගංජා හේන් 03 ක් වටලා අඩි 6 ක් පමණ උස ගංජා ගස් 7270 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට ගෙන කොස්ලන්ද පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 43 හා 67 වයස් වල පසුවන පනාමුර හා දිවුලම්පිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කොස්ලන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.









## 03. ගංජා හේන් දෙකක් වටලා සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා බුත්තල කඳවුර.

2025.01.30 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරු මත කතරගම පොලිස් වසමේ යාල රක්ෂිත ප්‍රදේශයේදී ගංජා හේන් දෙකක් වටලා අඩි 7 ක් පමණ උස ගංජා ගස් 98750 ක් පමණ ප්‍රමාණයක් සමඟ සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට ගෙන කතරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 46 හා 46 වයස් වල පසු වන මීද්දෙනිය හා ඇඹිලිපිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කතරගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**